

# වම්බටු වගාවේ

## රෝග හා පළිබෝධ හඳුනාගැනීම හා මර්ධනය කිරීම



## රූපමය කාඩ් පත්



ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර
ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

www.safe.doa.gov.lk

# වම්බටු වගාව

## රෝග හා පළිබෝධ හඳුනාගැනීම හා මර්ධනය කිරීම



## තාක්ෂණික දායකත්වය


- **එම්. එස්. ඩබ්. ප්‍රනාන්දු** - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව
- **ටී. කේ. ඒ. අයි. හජ්ජී** - ප්‍රාදේශීය පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල
- **එච්. ඒ. එස්. එන්. හෙට්ටිආරච්චි** - කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය
- **කේ. පුෂ්පාංජී** - කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය
- **ආචාර්ය පී. එච්. රණවීර** - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව
- **ආචාර්ය ජේ. පී. මාරසිංහ** - පළිබෝධනාශක රෙජිස්ටාර් කාර්යාලය, පේරාදෙණිය


## සැකසුම


- **ජී. එස්. පී. තෙන්නකෝන්** - ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නෝරුව
- **කේ. ඒ. යු. එන්. එන්. බණ්ඩාර** - ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නෝරුව





කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2024

# බටු කරටි හා ගෙඩි විදින්නා









**හානිවූ ගෙඩි හා කරටි**

මැලවුනු බටු කරටි වගාවේ දැකිය හැක. මැලවුන කරටි ආසන්නයේ පහලින් කුඩා තිතක් වැනි සිදුරක් දැකිය හැක.

**කීටයා**

මේරූ කීටයන් රෝස පැහයට හුරු මි.මී. 20 පමණ වේ. කීටයින් ළපටි රිකිලි තුලට හෝ ඵල තුලට ඇතුල් වී එහි කොටස් ආහාරයට ගනී. පිට කරන කළු පැහැති අපද්‍රව්‍ය වලින් සිදුරු පීරී පැවතිය හැකිය.

**සුහුඹුලා**

මි.මී. 10-12 ක් පමණ විශාල සුදු පැහැති පියාපත් මත දුඹුරු පැහැති ලප සලකුණු ඇත. පත්‍ර යටි පැත්තේ, රිකිලි මත, මල් මත හෝ ගෙඩි වල නටුව ආසන්නයේ බිත්තර තැන්පත් කරයි.

# බටු කරටි හා ගෙඩි විදින්නා



## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ක්‍රෝමෆෙනොසයිඩ් 50 g/l SC | මි.ලී. 32 |
| ක්ලෝරන්ට්‍රනිලිප්‍රෝල් 200 g/l SC | මි.ලී. 03 |
| ෆ්ලූබෙන්ඩියමයිඩ් 24% WG | ග්‍රෑම් 08 |
| ෆ්ලූබෙන්ඩියමයිඩ් 20% WG | ග්‍රෑම් 10 |
| එටෝෆෙන්ප්‍රොක්ස් 100 g/l EC | මි.ලී. 24 |
| ඩෙල්ටාමෙත්‍රින් 25 g/l EC | මි.ලී. 10 |
| ලැම්ඩා සයිහේලොත්‍රින් 50 g/1 SC | මි.ලී. 12 |

## වෙනත් පාලන ක්‍රම

- ❖ හානි වූ ගෙඩි හා මැලවී කඩා වැටී රිකිලි මැලවුණු ස්ථානයේ සිට අඟලක් පමණ පහලින් කපා විනාශ කර දැමීම.
- ❖ ෆෙරමෝන උගුල් භාවිතා කිරීම.
- ❖ සලඹයන් විකර්ෂණය සඳහාම නිපදවා ඇති විශේෂිත ඇටවුම් භාවිතා කිරීම.

## වළක්වා ගැනීම

- ❖ සිටුවීමට පෙර, පෙර කන්නයේ සියළුම ශාක අවශේෂ විනාශ කිරීම.
- ❖ බෝග මාරුව අනුගමනය කිරීම (සොලනේසියස් කුලයට අයත් නොවන බෝග සමඟ)
- ❖ වගා ක්ෂේත්‍රය වටා කෘමි බාධක දැලක් ගැසීම හෝ බාධක වැටක් ඉදිකිරීම



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# පිටි මකුණා







**හානි වු ශාක**

සුහුඹුලන් හා ශිෂුවන් අග්‍රස්ථයේ ඇති පත්‍ර වලින් යුෂ උරාබීම නිසා පත්‍ර ඇඹරී රැලි වැටී විකෘති වේ. මල් වලට හානි වු විට ඵල ඇතිවීම අඩු වේ.

**හානි වූ පත්‍රයක්**

පිටිමකුණන් විසින් ස්‍රාවය කරනු ලබන සීනිමය ද්‍රව්‍ය මත දිලීර පුස් වර්ග ඇති වී කළු පැහැ වේ. මෙය බෝගයේ ප්‍රභාසංස්ලේෂණය හෙවත් ආහාර නිෂ්පාදනය අඩු කරයි.

**පිටිමකුණා**

සුදු පැහැ ඉටිමය ද්‍රව්‍යයකින් වැසී ඇති ඕවලාකාර හැඩයක් සහිත පිටි මකුණන් මි.මී. 4-5ක් විශාල වේ. සුහුඹුලන් හා ශිෂුවන් පත්‍ර, ලපටි ශාක කොටස් හා ඵල මත යුෂ උරාබොයි.

# පිටි මකුණා



## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ඉමිඩක්ලොප්‍රිඩ් 200 g/l SL | මි.ලී. 16 |
| ෆිප්‍රොනිල් 50 g/l SC | මි.ලී. 16 |
| තයමෙතොක්සාම් 25% WG | ග්‍රෑම් 08 |
| ඇසිටැමිප්‍රිඩ් 200 g/l SL | මි.ලී. 16 |

## වෙනත් පාලන ක්‍රම

- පිටිමකුණන් සහිත ශාක කොටස් කපා විනාශ කිරීම
- පත්‍රවල යටි පැත්ත හොඳින් සේදී යන සේ ජලය යෙදීම

## වළක්වා ගැනීම

- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කිරීම
- ක්ෂේත්‍රය තුළ හා අවට හොඳින් වල් මර්ධනය කිරීම



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# සුදු මැස්සා







**සුදුමැස්සන්**

සුදු පැහැ පියාපත් සහිත මි.මී. 1-2 ක් පමණ විශාල වේ. බෝගයේ පත්‍රවල යටිපැත්තේ සිට යුෂ උරා බීම සිදු කරයි. මේ හේතුවෙන් පත්‍ර කහ පැහැයට හැරී පත්‍ර නාරටි පැහැදිළිවීමට පටන් ගනී. ශාකයේ වර්ධනය බාල වේ. හානිය අධික වු විට පත්‍ර හැළී යයි. වියළි කාල වලදී මොවුන්ගේ ගහණය සීග්‍රයෙන් වැඩි වේ.

**කළු පැහැවූ පත්‍රයක්**

මොවුන් විසින් ස්‍රාවය කරනු ලබන සීනිමය ද්‍රව්‍ය හේතුවෙන් පත්‍ර මත පුස් වර්ග සෑදී ඒවා කළු පැහැ වේ.



# සුදු මැස්සා

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

✸ මේ සඳහා පලිබෝධනාශක නිර්දේශ කර නොමැත.

## වෙනත් පාලන ක්‍රම

❖ ගහනය වැඩි විට කහ පැහැති ඇලෙන උගුල් භාවිතා කිරීම

## වළක්වා ගැනීම

❖ සිටුවීමට පෙර, පෙර කන්නයේ සියලුම ශාක අවශේෂ විනාශ කරන්න.

❖ වගා ක්ෂේත්‍රය වටා කෘමි බාධක දැලක් ගැසීම හෝ බාධක වැටක් ඉදිකිරීම

❖ රිදී පැහැති ආලෝක පරාවර්තිත පොලිතීන් වසුන් යෙදීම

❖ ක්ෂේත්‍රය තුළ හා අවට හොඳින් වල් මර්දනය කිරීම



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# පත්‍ර දැල් බඳින්නා





### පත්‍ර දැල් බඳින්නාගේ හානි

පත්‍ර දැලකින් මෙන් එකිනෙක රෝල් කර අලවා ඒ තුලට වී පත්‍ර ආහාරයට ගනී. රෝල් වී ඇති පත්‍ර තිබීමත් ඒ අසල කළු පැහැයෙන් ඔවුන්ගේ අපද්‍රව්‍ය තිබීමෙනුත්හානිය හඳුනාගත හැකිය. මල් හා අංකුරවලටද හානිකරයි.

### සුහුඹුල් සලබයා

සුහුඹුල් සලබයා කහ පැහැතිය. මි.මී. 20 ක් පමණ විශාලය. පත්‍ර මත ගැහැණු සලබයා විසින් බිත්තර පොකුරු වශයෙන් තැන්පත් කරයි.

# පත්‍ර දැල් බඳින්නා



## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

- මේ සඳහා පලිබෝධනාශක නිර්දේශ කර නොමැත.

## වෙනත් පාලන ක්‍රම

- හානිය පාලනය සඳහා දැල් බැඳ ඇති පත්‍ර කොටස් කපා විනාශ කර දමන්න.
- සලබයන් විකර්ෂණය සඳහා නිපදවා ඇති විශේෂිත කහ පැහැති බල්බ උගුල් භාවිතා කරන්න.



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# මයිටාවා







### හානි වූ පත්‍රයක යටිපැත්ත

යුෂ උරාබීම හේතුවෙන් පළමුව පත්‍ර දිළිසෙන සුළු ස්වභාවයක් ගන්නා අතර ක්‍රමයෙන් පත්‍ර තලය ගොරෝසු වී රතු දුඹුරු පැහැයට හැරී වියළී වැටේ. ළපටි පත්‍ර වලට හානි සිදු කළ විට පත්‍ර යටි පැත්තට කුඩයක් ආකාරයට නැවේ.

### හානි වූ ගෙඩියක්

හානිය උග්‍ර විට ඵල වලටද හානි සිදුකරයි. දුඹුරු පැහැති ඉරිතැලුණු ස්වභාවයක් ඵල මතුපිට දක්නට ලැබේ. මල් පිපෙන කාලවලදී හානිය ඇති විට මල් හැලී යයි.

### මයිටාවන්

මයිටාවන් පියවි ඇසට පැහැදිලිව නොපෙනේ. පාද යුගල් 4 ක් සහිතය. රතු පැහැති ඉතා කුඩා ජීවීන් වන මොවුන් පත්‍රයේ යටි පැත්තේ ඍණාවාස ලෙස ජීවත්වෙමින් ශාකයෙන් යුෂ උරා බොයි.





# මයිටාවා

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| හෙක්සිතයොසොක්ස් 10% EC | මි.ලී. 24 |

## වෙනත් පාලන ක්‍රම

- විසුරුම් ජල සම්පාදනය භාවිතා කිරීම.
- හානිය මුල් අවස්ථාවේදීම හානිකල කළ පත්‍ර ඉවත්කර විනාශ කිරීම.
- හානිය මුල් අවස්ථාවේදීම කොහොඹ නිස්සාරකය භාවිතා කිරීම.
- ජෛව පාලකයින් යොදා ගැනීම.
- බෝග සනීපාරක්ෂාව හා නඩත්තුව පවත්වා ගැනීම.

## වළක්වා ගැනීම

- සිටුවීමට පෙර, පෙර කන්නයේ සියළුම ශාක අවශේෂ විනාශ කරන්න.
- ක්ෂේත්‍රය තුළ හා අවට හොඳින් වල් මර්ධනය කිරීම.



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# පාමුල / පාදස්ථ කුණුවීමේ රෝගය



**ආසාදිත ශාකයක්**

දිවා කාලයේ ශාක මැලවීයයි. පසු අවස්ථාවේ ස්ථිරවම මැලවේ. මුල් කුණු වී යයි. සුදු හෝ දුඹුරු දිලීර ජාල හෝ අබ ඇට වැනි ව්‍යුහයන් පසට ආසන්නව කඳේ දැකිය හැක.



**ආසදිත ශාකයක පත්‍රයක්**

ආසාදිත ශාකවල පත්‍ර කහ පැහැ වී මැළවී යයි.



**ආසදිත ශාකයක කඳෙහි හරස්කඩ**

කඳ තුළ දුඹුරු පැහැ වේ.

# පාමුල / පාදස්ථ කුණුවීමේ රෝගය



## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

* ආසාදන ඇති ස්ථානවලට පමණක් ස්ථානීයව නිර්දේශිත දිලීරනාශක

| දිලීරනාශකය | ජලය ලීටර් 05ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| කැප්ටාන් 50% WP | ග්‍රෑම් 06 |
| තිරාම් 80% WP | ග්‍රෑම් 07 |
| තයිෆොනෙට් මීතයිල් 50% + තිරාම් 30% WP | ග්‍රෑම් 05 |

## වෙනත් පාලන ක්‍රම

- ආසාදිත ශාක, පස් සමග ගලවා ඉවත් කිරීම.
- ජල වහනය වැඩිදියුණු කිරීම

## වළක්වා ගැනීම

- ගැඹුරට සීසෑමෙන් ආසාදිත පස් සූර්යයාලෝකයට නිරාවරණය කිරීම.
- පැල සිටුවීමේදී මුල්වලට සිදුවන හානිය අවම කිරීම.
- බීජ පැල ක්ෂේත්‍රයේ රෝපණය කිරීමේදී මුල්වලට හානිවීම වැලැක්වීම.
- රෝගය සඳහා පත්‍රීනොවන භෝග (කෲසිපරේසේ කුලයේ කුලයට අයත් ගෝවා, රාබු, නෝකෝල්, වැනි භෝග) සමග භෝග මාරුවක් සිදුකිරීම.
- බීජ ප්‍රතිකාර කිරිම ( බීජ පැල කිරීමට ප්‍රථම බීජ කිලෝ 1ක් සඳහා කැප්ටාන් 50% WP ග්‍රෑම් 4 හෝ තිරාම් 80% WP ග්‍රෑම් 5 ක් හෝ තයිෆොනේට් මිතයිල් 50% + තිරාම් 30% WP ග්‍රෑම් 4 ක් සමඟ හොඳින් මිශ්‍ර කිරීම)



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# බැක්ටීරියා හිටු මැරීමේ රෝගය









**ආසාදිත ශාකයක්**

ආරම්භක රෝග ලක්ෂණ වන්නේ තනි අතු හෝ අතු කිහිපයක් සුළු වශයෙන් මැලවීයාම.

**ආසාදිත ශාකයක්**

දින කිහිපයකට පසු මුළු ශාකයම හදිසියේ ස්ථිර ලෙස මැලවීයයි.

**රෝගය හඳුනා ගැනීම**

ආසාදිත කොටස් කෙලවර කැපූ පෘෂ්ඨය පිරිසිදු ජලයේ ගිල්වූවිට සුදු පැහැති බැක්ටීරියා ස්‍රාවයක් පිටවීම මගින් මෙම රෝගය හඳුනාගත හැක.

# බැක්ටීරියා හිටු මැරීමේ රෝගය



## රසායනික පාලනය - නිර්දේශිත රසායනික

- මෙම රෝගය සඳහා නිර්දේශිත රසායනික නොමැත.

## වෙනත් පාලන ක්‍රම

- මුල් හා අවට පස් සමග ශාකය ගලවා පිලිස්සීම /ගැඹුරින් වළදැමීම.
- ජල වහනය වැඩිදියුණු කිරීම
- ආසාදිත ක්ෂේත්‍ර හරහා නිරෝගී ක්ෂේත්‍රයකට ජලය සැපයීමෙන් වැලකීම
- ආසාදිත ක්ෂේත්‍රවල සිට ආසාදිත නොවන ක්ෂේත්‍ර වෙත ජලය /ගොවිපල උපකරණ / මෙවලම් ගෙනයාමෙන් වැලකී සිටීම.

## වළක්වා ගැනීම

- භෝග අවශේෂ විනාශකිරීම
- පසට හොඳින් දිරාපත් වූ කොම්පෝස්ට් හෝ ගොම පොහොර හෝ කර දහයියා යෙදීම.
- ප්‍රතිරෝධී ප්‍රභේද භාවිතය (අංජලී, පාදාගොඩ)
- භෝග මාරුවක් සිදුකිරීම (කෘසිපරේසේ කුලයේ කුලයට අයත් ගෝවා, රාබු, නෝකෝල් වැනි භෝග) සමග.



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# පත්‍ර සිහින් වීමේ රෝගය



***ආසාදිත ශාකයක්***



***ආසදිත ශාකයක්***



***ආසදිත ශාකයක්***

කුඩා පත්‍ර ඇතිවීම. පැති අංකුර විශාල වන නමුත් ඒවායේ පත්‍ර නටු සහ කොළ කෙටි වන අතර, පර්ව අතර දුර අඩුවී ශාකයට පඳුරු පෙනුමක් ලබා දෙයි. කොළ පටු, මෘදු, සිනිඳු සහ කහ පැහැති වේ. යුෂ උරාබොන කෘමීන් පත්‍ර යටි පැත්තේ දැකගත හැකිය. බොහෝ විට මල් පිපීම සිදු නොවේ. නමුත් මල් හටගන්නේ නම් ඒවා කොළ පැහැ වේ. ගෙඩි හටගන්නේ කලාතුරකිනි. බලපෑමට ලක් වු ශාක පල දරන්නේ නැත.

# පත්‍ර සිහින් වීමේ රෝගය

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

- මෙම රෝගය සඳහා නිර්දේශිත රසායනික නොමැත.
- රෝග වාහකයා (කීඩෑවා) පාලනයට නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ඇසිටම්ප්‍රිඩ් 20% SP | ග්‍රෑම් 16 |
| ඇසිටම්ප්‍රිඩ් 200 g/l EC | ග්‍රෑම් 16 |
| තයාමෙතොක්සාම් 25% WG | ග්‍රෑම් 05 |
| ඇසිෆේට් 75% SP | ග්‍රෑම් 16 |

## වෙනත් පාලන ක්‍රම

- ආසාදිත ශාක උදුරා පුළුස්සා දැමීම.
- සිටුවීමට පෙර, පෙර කන්නයේ සියළුම ශාක අවශේෂ විනාශ කිරීම.
- වගා ක්ෂේත්‍රය වටා කෘමි බාධක දැලක් ගැසීම හෝ බාධක වැටක් ඉදිකිරීම (බඩඉරිඟු).



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# ෆොමොප්සිස් අංගමාරය







**ආසාදිත ගෙඩියක්**

ආසාදිත ගෙඩි මත කුඩා, ගිළුණු අඳුරු පැල්ලම් දිස්වන අතර පසුව එම ප්‍රදේශ කුණුවීම සිදුවේ. දිලීර වර්ධනය සමග පැල්ලම්වල කේන්ද්‍රය දුඹුරු පැහැයේ සිට කළු පැහැයට හැරේ.

**ආසාදිත කඳක්**

ආසාදිත ශාක පත්‍ර, නටු සහ කඳ කොටස් මත කළු පැහැ දාර සහිත දුඹුරු පැහැති ලප ඇතිවේ.

# ෆොමොප්සිස් අංගමාරය

## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

- මෙම රෝගය සඳහා නිර්දේශිත රසායනික නොමැත.

## වෙනත් පාලන ක්‍රම

- ආසාදිත ශාක කොටස් ක්ෂේත්‍රයෙන් ඉවත්කිරීම හා විනාශකිරීම.



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# ඇන්ත්‍රැක්නෝස් රෝගය



**ආසාදිත පත්‍රයක්**

පත්‍රවල දුඹුරු පැහැ ලප ඇතිවේ.



**ආසාදිත ගෙඩියක්**

ඵල මත රවුම් හැඩැති ගිළුණු ලප ඇතිවේ. මෙම පැල්ලම් මැද තඹ පැහැයේ සිට තැඹිලි පැහැයට වූ කළු පැහැති කේන්ද්‍රයේ මුදු දැකිය හැක.

# ඇන්ත්‍රැක්නෝස් රෝගය



## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

| දිලීරනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| මෙට්රාම් 50% + පයිරක්ලොස්ට්‍රොබීන් 5% WP | ග්‍රෑම් 32 |
| ෆ්ලූසිනාම් 500 g/l SC | මි.ලී. 16 |
| ක්ලෝරතැලොනිල් 500 g/l SC | මි.ලී. 48 |
| තයොෆනේට් මීතයිල් 70% WP | ග්‍රෑම් 16 |

* වර්ෂා කාලයේදී මල් හටගන්නා අවස්ථාවේ සිටදින 7-10 කාල පරතරයක් ඇතිව දිලීරනාශක යොදන්න

## වෙනත් පාලන ක්‍රම

- නීරෝගී බීජ භාවිතා කිරීම
- පත්‍ර මත තෙතමනය අඩුකිරීම සඳහා හැකිතරම් විසිරුම් ජල සම්පාදන ක්‍රමවලින් ඉවත්විම
- ආසාදිත ශාක කොටස් ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීම හා විනාශකිරීම.
- සොලනේසේ කුලයේ භෝග හැර වෙනත් භෝග සමග භෝග මාරුවක් සිදුකිරීම.

## වළක්වා ගැනීම

- ආසාදනය නොවූ බීජ භාවිතා කිරීම.
- නිවැරදි කාලයට වගා කිරීම.
- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කිරීම.
- ක්ෂේත්‍රය තුළ හා අවට හොඳින් වල් මර්දනය කිරීම.
- අස්වැන්න නෙලීමෙන් පසු ඉතිරිවන හෝ හානිවූ කොටස් ක්ෂේත්‍රයෙන් ඉවත්කිරීම



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර
ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

www.safe.doa.gov.lk